# එළවළු අපතේයාම වලකා ගැනීම

ගොවීන් විසින් නිෂ්පාදනය කරනු ලබන එළවළු දුර බැහැර ප්‍රදේශ වල සිටින පාරිභෝගිකයින් අතට පත්වන විට, 'එවායේ තත්වය බොහෝ සෙයින් දුර්වල වීම අප රටේ බහුල වශයෙන් සිදුවන දෙයකි. එපමණක් නොව මෙසේ නිපදවන එළවළු වලින් 20%-30% දක්වා ප්‍රමාණයක් අපතේ යයි.

මෙලෙස අස්වනු නෙලු අවස්ථාවේ සිට පාරිභෝගිකයා අතට පත්වන තුරු සිදුවන හානි සියල්ල පසු අස්වනු හානි ලෙස හඳුන්වනු ලැබේ. මේ නිසා ගොවියා හට ඉතා අඩු මුදලකට තම නිෂ්පාදිතයන් අලෙවි කිරීමට සිදුවන අතර, පාරිභෝගිකයා හට විශාල මිළක් ගෙවා අවශ්‍ය එළවළු මිලදී ගැනිමට සිදුවේ.

විශාල වශයෙන් සිදුවන පසු අස්වනු හානියට ප්‍රධාන වශයෙන් හේතුවන සාධක කීපයකි. ජලය පිටවීම නිසා බර අඩුවීම, මේරීම, තැලීම් හා සිහිරීම් සිදුවීම, කුණුවීම යනාදිය මේ අතුරින් ප්‍රධාන තැනක් ගනී. කෙසේ වෙතත් මෙසේ පසු අස්වනු හානිය නිසා අපතේ යන ප්‍රමාණය කෙරෙහි පෙර අස්වනු සාධක ද බොහෝ විට බලපෑමක් ඇති කරයි.

පෙර අස්වනු සාධක ලෙස හඳුන්වනු ලබන්නේ අස්වනු නෙලීමට පෙර ක්ෂේත්‍රයේදී පැවැති තත්වයන්ය. අක්‍රමවත් පොහොර භාවිතය, අඩු ජලසම්පාදනය, අධික ආර්ද්‍රතාවය සහ වෙනත් අයහපත් වගා පාලන ක්‍රම අස්වැන්නෙහි තත්වය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරයි. පෙර අස්වනු සාධක මනා ලෙස පාලනය කර, උසස් පසු අස්වනු තාක්ෂණ ක්‍රම අනුගමනය කිරීමෙන් අපතේ යන එළවළු ප්‍රමාණය බොහෝ දුරට අඩුකර ගත හැකිය.

## අස්වනු නෙලිය යුතු අවස්ථා

- තක්කාලි අස්වනු නෙලීමට වඩාත් සුදුසු අවස්ථාව වන්නේ ගෙඩියෙහි රතු පැහැය අවම වශයෙන් 50% ක් වත් දක්නට ලැබෙන විටය. අස්වනු නෙලීමේදී නටුව ගෙඩියට සවිවී තිබෙන පරිදි නෙලීම කළ යුතුය. නටුව වෙන් වුවහොත් ඇතිවන තුවාලය නිසා එම ස්ථානයෙන් කුණුවීමට ඉඩ තිබේ. නටුව සමග නෙලු තක්කාලි නොගැඹුරු ලී පෙට්ටි හෝ ප්ලාස්ටික් කූඩා වල ඇසිරීම කළ යුතුයි. නෙලා ගැනීමෙන් පසුව හැකිතාක් දුරට පරිහරණය කරන වාර ගණන අඩු කිරීමෙන් තක්කාලි වල පසු අස්වනු හානිය අඩුකර ගත හැකිය.
- මෑ, බෝංචි වැනි එළවළු බොහෝ විට නාස්ති වන්නේ මේරීම සිදුවන නිසාය. ළපටි අවස්ථාවේදී නෙලීමෙන් මේරීම සිදුවන වේගය අඩුකර ගත හැකිය. එබැවින් මෙම එළවළු වගී දෙක කරලේ දිග උපරිම මට්ටමට පත් වූ වහාම අස්වනු නෙලීම සුදුසුය. කරල පිරෙන තුරු සිටියහොත් ඉක්මණින් මේරීම සිදුවන බැවින් අපතේ යන ප්‍රමාණය වැඩිවේ. ළපටිව නෙලාගත් විට, වැඩි කරල් ගණනක් සැදෙන බැවින් ගොවියාට තම ඉඩමෙන් ලැබෙන මුළු අස්වැන්න වැඩි කර ගත හැකිය.
- බණ්ඩක්කා කරල්, උපරිම දිගට පැමිණීමට දින දෙකකට පමණ පෙර නෙලා ගැනීමෙන් මේරීම නිසා අපතේ යන ප්‍රමාණය අඩුකර ගත හැකිය. ළපටිව අස්වනු නෙලු විට දින දෙකකට වරක් බැගින් අස්වනු නෙලිය හැකි අතර එවිට ඉඩමෙන් ලැබෙන මුළු අස්වනු ප්‍රමාණය වැඩි වේ.
- වැටකොළු, පතෝල, කරවිල යන එළවළු අස්වනු නෙලීමට වඩා සුදුසු වන්නේ එම ඵල (කරල්) උපරිම දිගට පත්වන අවස්ථාවේ දීය. ඵල පිරීමේ අවස්ථාව දක්වා නෙලීම පමා කළහොත් වැටකොළු වල මේරීම ද, පතෝල, කරවිල වල ඉදීම ද ඉක්මන් වීම නිසා වෙළඳ අගය අඩුවීම සහ ආහාරයට නුසුදුසු තත්වයට පත්වීමට සිදුවේ. වැටකොළු සහ කරවිල ප්ලාස්ටික් බඳුන් වල ඇසිරිය හැකි අතර පතෝල වල මැද කුහරයක් ඇති බැවින් තැලීම සිදුවුවහොත් පහසුවෙන් පිපිරීමට ඉඩ තිබේ. එබැවින් කූඩා ප්‍රමාණයේ මිටි වශයෙන් ඇසිරීම කළ හැකිය.
- වම්බටු වල ඵලයෙහි උපරිම දිගට පත් වූ විට, එය නෙලීමට වඩාත් සුදුසු අවස්ථාව වේ. ඵල පිරීම දක්වා සිටියහොත් මේරීම සිදුවන නිසා තත්වය පහළ යයි. ළපටි අවස්ථාවේ අස්වනු නෙලු විට දිගුකාලීනව ඉඩමෙන් ලැබෙන අස්වැන්න වැඩිවීම ගොවියාට වඩා වාසිදායක වේ. මෙසේ නෙලන ලද ඵල ප්ලාස්ටික් අසුරනුවල අසුරා ප්‍රවාහනය කල හැකිය.
- සලාද සඳහා පිපිඤ්ඤා යොදා ගන්නා අවස්ථා වලදී ඉතා ළපටි අවස්ථාවේදී අස්වැන්න නෙලා ගත යුතුය. මේ සඳහා ඵලය සම්පූර්ණ වීමට පෙර නෙලා ගත යුතුය. පිසීම සඳහා භාවිතා කරන්නේ නම් තරමක් මේරූ අවස්ථාව වඩා සුදුසුය. කෙසේ වුවද පිට පොත්ත දුඹුරු පැහැ ගැන්වීමට ප්‍රථම අස්වනු නෙලීම වැදගත්ය.

- බීට්, නෝකෝල්, රාබු වැනි එළවළු නියමිත දින ගණනට පසු එනම් නිසි පරිදි මෝරා ඇතිවිට අස්වනු නෙලීමෙන් ගුණාත්මක බවින් වැඩි සහ උසස් තත්වයෙන් යුත් අස්වැන්නක් ලබාගත හැකිය. මෙම එළවළු වර්ගයන්හි අස්වනු නෙලන විට, ශාකවල පත්‍ර නොකැඩෙන පරිදි ගලවා ගත යුතුය. මඩ ඉවත් කිරීම සඳහා "අල" පමණක් ජලයෙන් සේදීම වඩාත් සුදුසුය. පත්‍ර නොතැලෙන පරිදි ඇසිරීම මගින් මෙම එළවළු වල උසස් තත්වය දින කීපයක් ආරක්ෂා කරගත හැකිය.
- ගෝවා වල ගෙඩිය හොඳින් වැඩී ඇතිවිට අස්වැන්න නෙලීම කළ යුතුය. වටේට පිහිටි පත්‍ර කිපයක් සමග ප්‍රවාහනය කිරීමෙන් ගෙඩියට සිදුවන යාන්ත්‍රික හානි බොහෝ දුරට අඩුකර ගත හැකිය.
- ලීක්ස් ශාකය හොඳින් වර්ධනය වූ විට, පත්‍ර නොකැඩෙන පරිදි ගලවා මුල් කොටස පමණක් ජලයෙන් සෝදා මඩ ඉවත් කළ හැකිය. තද කර මිටි බැඳීම නොකළ යුතුයි.
- මාළු මිරිස් කරල වර්ධනය වූ විට අස්වැන්න නෙලිය යුතුය. මේරීම වැඩි වූ විට ඉක්මණින් ඉදෙන බැවින් නියමිත අවස්ථාවේදී අස්වැන්න නෙලීම වැදගත්ය.
- මුකුණුවැන්න, කංකුං, ගොටුකොළ වැනි කොළ එළවළු මේරීමට ප්‍රථම අස්වැන්න නෙලිය යුතුය. නෙලූ කොළ ක්ෂේත්‍රයේදීම මිටි බැඳ තෙතමනය ඉවත්නොවන සේ තැබිය යුතුය.

## නෙලන අවස්ථාවේදී සැලකිලිමත් වීම

සෑම එළවළුවක්ම උදයේ පිණි හිඳුනු පසු අස්වනු නෙලීම වඩාත්ම උචිතය. කොළ එළවළු ක්ෂේත්‍රයේදී තරමක් "හේබාන" තෙක් සිට නෙලූවහොත් ඇසිරීමේදී සහ ප්‍රවාහනයේදී ඇතිවන හානිය අඩුකර ගත හැකිය. කිසිම අවස්ථාවකදී නෙලන ලද එළවළු, ක්ෂේත්‍රයේ පස් සමග ගැටීමට සැලැස්වීම සුදුසු නැත. පස් තැවුරුණු විට ඒ සමග නොයෙකුත් දිලීර හා බැක්ටීරියා රෝගකාරක ජීවීන් ඇතුල්වීමට පුළුවන.

අස්වනු නෙලිමේදී රළු ලෙස එළවළු පරිහරණය නොකරන්න. හැකි ඉක්මණින් නෙලන ලද එළවළු සෙවන සහිත ස්ථානයකට රැගෙන යන්න.

## ශ්‍රේණි කිරීම

තේරීම සහ වර්ග කිරීම ක්ෂේත්‍රයේදී අනිවාර්යයෙන්ම කළ යුතුය. පළමුවැනි සහ දෙවැනි පන්තිය වශයෙන් මතුපිට පෙනුම අනුව වර්ග කළ හැකියි. වර්ග කර විකිණීමෙන් වැඩිපුර ආදායමක් ලබාගත හැකිවනවා මෙන්ම ප්‍රවාහන හානි සහ ලෙඩරෝග නිසා සිදුවන හානි ද අවම කරගත හැකිය.

## ඇසිරීම

සෑම එළවළුවක්ම සිදුරු සහිත ප්ලාස්ටික් කූඩා වල හෝ ලෑලි වලින් තනන ලද පෙට්ටි වල අසුරන්න. එමගින් එළවළු වල තත්වය ආරක්ෂා කරගත හැකිය. ඇසිරීමේදී රළු ලෙස එළවළු පරිහරණය නොකළ යුතු අතර අනවශ්‍ය ලෙස තද කර භාජනයක ඇසිරීම නොකල යුතුයි. ප්ලාස්ටික් බඳුන් නිතර පිරිසිදු කළ යුතු අතර ඇසුරුම් කිසි විටෙකත් අව්වට හෝ වැස්සට නිරාවරණය නොකළ යුතුය.

## ඉදෙන පළතුරු සමග

එළවළු වලට එතිලීන් වායුවේ බලපෑම ඉතාමත්ම අහිතකර වේ. ඉදෙන තක්කාලි, කෙසෙල්, අඹ, අලිපේර වලින් මෙම වායුව පිටවේ. තාවකාලික ගබඩා ස්ථානයක හෝ මෙම පළතුරු, එළවළු සමග තැබීමෙන් පළතුරු වලින් පිටවන එතිලීන් වායුවට එළවළු නිරාවරණය වේ. එසේවුවහොත් මේරීම ඉක්මන්වීම, කොළ කහපැහැ වීම, ඉදීම සහ එළවළු විනාශවී යෑමට ද ඉහළ ප්‍රවණතාවයක් ඇත. එබැවින් ප්‍රවාහනයේදී පවා එළවළු පළතුරු සමග මිශ්‍ර කොට ප්‍රවාහනය කිරීමෙන් වැළකීම වඩාත් උචිතය.

## යාන්ත්‍රික හානි

නිවැරදි මේරීමේ අවස්ථාවේදී, ප්‍රවේශමෙන් යුතුව නිසි තත්ව පාලනයක් යටතේ අස්වැන්න නෙලන ලද එළවළු වර්ග සඳහා ලෙඩ රෝග වැළඳීමේ හැකියාව ඉතා අඩුය. කෙසේ වෙතත් අස්වනු නෙලීමේදී, ඇසිරීමේදී සහ ප්‍රවාහනයේදී සිදුවන තැලීම්, සීරීම් වැනි යාන්ත්‍රික හානි නිසා ලෙඩ රෝග වැළඳීම සිදුවේ. එනිසා ලෙඩරෝග මර්දනය සඳහා අනිවාර්යයෙන්ම යාන්ත්‍රික හානි සිදුවීම වැළැක්විය යුතුය.

ප්‍රවාහනය කිරීමේදී ප්‍රවේශමෙන් ඇසිරීම කළයුතුය. රාත්‍රී කාලයේදී හෝ උදය කාලයේදී ප්‍රවාහනය කිරීමෙන් අධික ලෙස උෂ්ණත්වය ඉහළයෑම වලක්වා ගත හැකියි. තවද ප්‍රවාහනයේදී අව්වෙන් සහ වැස්සෙන් ආරක්ෂා කරගත යුතුය. වාහනය සුමට ලෙස පැදවීමෙන් ප්‍රවාහනයේදී ඇතිවන හානි අඩුකර ගත හැකිය. එසේම බෑමද ප්‍රවේශමෙන් කළයුතුය.

අප රටෙහි එළවළු නිෂ්පාදනය අවුරුද්ද මුළුල්ලේම සිදුවන බැවින් දීර්ඝ කාලීන ශීත ගබඩා කිරීම අනවශ්‍යය. බොහොමයක් එළවළු සති 2 ක් හෝ 3 කට වැඩි කාලයක් ගබඩා කර තබාගත නොහැකිය. එසේ ගබඩා කළද දැරීමට සිදුවන අමතර වියදම නිසා ආර්ථික වාසිදායක තත්වයක් ගෙන නොදේ. වඩාත්ම සුදුසු විකල්පය වන්නේ අකාලයේ නිෂ්පාදනය කිරීමට සැලසුම් කිරීමයි.